## අ.පො.ස. සාමාන්‍ය පෙළ

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

# Business and Accounting Studies

## උපකාරක සේවා

## Supporting Services



සැකසුම හා ඉදිරිපත් කිරීම:-


## ධම්මික හෙට්ටිආරච්චි

රජයේ පිළිතුරු පත්‍ර පරීක්ෂක

Teacher of St. Peter's College

T.P. 077 6530215

# උපකාරක සේවා

# Supporting Services

අන්තර්ගතය

- ✦ උපකාරක සේවා
    - ★ බැංකු සේවා
        - තැන්පතු ආශ්‍රිත
        - විද්‍යුත් මුදල් ආශ්‍රිත
    - ★ රක්ෂණ සේවා
    - ★ සන්නිවේදන සේවා
    - ★ ප්‍රවාහන සේවා

# උපකාරක සේවා

## උපකාරක සේවා හඳුන්වන්න.

ව්‍යාපාර කටයුතු සාර්ථක ලෙස පවත්වාගෙන යාම සඳහා විවිධ සේවාවන් වල සහය අවශ්‍ය වේ. එසේ සහාය වන සේවා උපකාරක සේවා ලෙස හැදින්වේ.

## උපකාරක සේවා සඳහා නිදසුන්.

බැංකු සේවා.
රක්ෂණ සේවා.
සන්නිවේදන සේවා.
ප්‍රවාහන සේවා.

# බැංකු සේවා

## බැංකුවක් යනු කුමක්ද?

ගණුදෙනුකරුවන්ගේ මුදල් තැන්පතු භාර ගැනීමත්, ණය දීමත්, වෙනත් විවිධ සේවා සැපයීම සඳහාත් පිහිටුවා ඇති ආයතන බැංකු ලෙස සරලව හැඳින්විය හැකිය.

## බැංකු වර්ග.

1. මධ්‍යම බැංකුව
2. බලපත්‍රලාභී වාණිජ බැංකු
3. බලපත්‍රලාභී විශේෂිත බැංකු
4. විශේෂිත මූල්‍ය ආයතන






# වාණිජ බැංකු

## වාණිජ බැංකුවක් යනු කුමක්ද?

ඉතිරි කිරීමේ හා ස්ථාවර තැන්පතු ගිණුම් මෙන්ම ජංගම ගිණුම් ද පවත්වාගෙන යමින් ව්‍යාපාර කටයුතු වලට අවශ්‍ය විවිධ බැංකු සේවාවන් සපයනු ලබන ආයතන වාණිජ බැංකු ලෙස හැඳින්විය හැකිය.

ශ්‍රී ලංකා මහබැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ කටයුතු කරන නිසා මේවා බලපත්‍රලාභී වාණිජ බැංකු ලෙසද හඳුන්වනු ලබයි.

# වාණිජ බැංකු සඳහා නිදසුන්

- දේශීය රාජ්‍ය අංශය සතු වාණිජ බැංකු
  - ★ ලංකා බැංකුව
  - ★ මහජන බැංකුව




- දේශීය පෞද්ගලික අංශය සතු වාණිජ බැංකු
  - ★ කොමර්ෂල් බැංකුව
  - ★ පෑන්ඒෂියා බැංකුව
  - ★ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
  - ★ සම්පත් බැංකුව
  - ★ එන්.ඩී.බී. බැංකුව
  - ★ හැටන් නැෂනල් බැංකුව
  - ★ සෙලාන් බැංකුව
  - ★ යුනියන් බැංකුව
  - ★ ඩී.එෆ්.සී.සී. බැංකුව



- විදේශීය වාණිජ බැංකු

  - ★ ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව
  - ★ සිටි බැංකුව
  - ★ මුස්ලිම් කොමර්ෂල් බැංකුව
  - ★ හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකුව (H.S.B.C.)
  - ★ ඉන්දියානු රාජ්‍ය බැංකුව
  - ★ අයි.සී.අයි.සී.අයි. බැංකුව



# වාණිජ බැංකු මගින් ලබාගත හැකි සේවා

## වාණිජ බැංකුවලින් ලබාගත හැකි සේවා

- **තැන්පතු ආශ්‍රිත සේවා**
  - නිදසුන්:
    - ඉතිරිකිරීමේ තැන්පතු
    - කාලීන තැන්පතු
    - ජංගම තැන්පතු
- **ණය ආශ්‍රිත සේවා**
  - නිදසුන් :
    - කෙටිකාලීන ණය
    - දිගුකාලීන ණය
- **විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා**
  - නිදසුන් :
    - ණයපත් නිකුතුව
    - හරපත් නිකුතුව
    - ටෙලර් කාඩ් නිකුතුව
- **විදේශ විනිමය ආශ්‍රිත සේවා**
  - නිදසුන් :
    - අනේවාසික විදේශ මුදල් ගිණුම්
    - විදේශ මුදල් මිලදී ගැනීම
    - විදේශ මුදල් විකිණීම
- **වෙනත් සේවා**
  - නිදසුන් :
    - උකස් සේවාව
    - ආරක්ෂිත සේවාව
    - උපදේශන සේවාව
    - කල්බදු සේවාව

පහත දැක්වෙන සේවා පිළිබඳව පමණක් මෙහිදී සලකා බැලේ.

01. තැන්පතු ආශ්‍රිත සේවා

02. විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා

## 01. තැන්පතු ආශ්‍රිත සේවා

❖ වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් වර්ග

- ඉතිරිකිරිමේ ගිණුම්.
- ස්ථාවර තැන්පතු ගිණුම්.
- ජංගම ගිණුම්.

### ඉතිරිකිරීමේ ගිණුම්

✓ ව්‍යාපාරිකයන්ට මෙන්ම ඕනෑම පුද්ගලයෙකුට කැමති විටක මුදල් තැන්පත් කිරීමටත් එම තැන්පතු ආපසු ලබාගැනීමටත් හැකියාවක් ඇති ගිණුම් විශේෂයකි.

✓ එම ගිණුම් සඳහා යම් ප්‍රතිශතයක් යටතේ බැංකුව විසින් පොළී ගෙවනු ලැබේ.

## ඉතිරිකිරීමේ ගිණුමක ලක්‍ෂණ

- සුළු මුදලකින් වුවද ආරම්භ කළ හැකි වීම.
- ඕනෑම විටෙක මුදල් තැන්පත් කළ හැකිය.
- අවශ්‍ය අවස්ථාවක තැන්පතු ආපසු ලබා ගැනීමේ හැකියාව ද ඇත.
- තැන්පතු සඳහා නිශ්චිත පොලියක් හිමිවේ.
- මෙම ගිණුම් තනි තනිව මෙන්ම බද්ධ ගිණුම් වශයෙන් ද ආරම්භ කළ හැකිය.
- පාස්පොත හිමිවේ.

## වාණිජ බැංකු හඳුන්වාදී ඇති විශේෂිත ඉතිරිකිරීමේ ගිණුම්

**නිදසුන්:-** ළමා ඉතිරි කිරීමේ ගිණුම්.
කාන්තාවන් සඳහා වන ඉතිරි කිරීමේ ගිණුම්.
ධනයෝජන ඉතිරි කිරීමේ ගිණුම්.
ජ්‍යේෂ්ඨ පුරවැසි ගිණුම්.
අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු.

- ඉතිරිකිරීමේ ගිණුම්වලින් තැන්පතු හිමියන්ට ලැබෙන ප්‍රයෝජන

I. මුදල්වලට ආරක්ෂාවක් ලැබීම.
II. පොලී ආදායමක් ලැබීම.
III. ඕනෑම අවස්ථාවක මුදල් තැන්පත් කළ හැකි වීම සහ ආපසු ගැනීමට හැකිවීම.
IV. හදිසි අවස්ථාවලදී පහසුවෙන් මුදල් ආපසු ලබාගත හැකි වීම.
V. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් ගනුදෙනු කළ හැකි වීම
VI. හරපත් මගින් ගෙවීම් කටයුතු කළ හැකි වීම.

- ඉතිරිකිරීමේ ගිණුමක් ආරම්භ කිරීමේ ක්‍රියා පටිපාටිය.

(I) බැංකුව විසින් ලබාදෙන;

- ගිණුම විවෘත කිරීමේ අයදුම් පත්‍රය.
- මුදල් තැන්පතු පත්‍රය.
- ගනුදෙනු පිළිබඳ තොරතුරු දැනගැනීමේ පත්‍රය.
- දේශීය ආදායම් පනත ට අනුව කරන ප්‍රකාශය.

නිවැරදිව සම්පූර්ණ කර ජාතික හැඳුනුම්පත සමග භාරදිය යුතු වේ.

(II) බැංකුව නියම කරන අවම මුදල හෝ ඊට වැඩි මුදලක් තැන්පත් කළ යුතුය.

(III ) මෙම අවශ්‍යතා සම්පූර්ණ කළ පසු බැංකුව විසින් ඉතිරිකිරීමේ පාස්පොතක් ගනුදෙනුකරු වෙත නිකුත් කරනු ලැබේ.

- ඉතිරිකිරීමේ පාස්පොතක ඇතුළත් වන දෑ
  - ✓ මුදල් තැන්පත් කරන හෝ ආපසු ගන්නා දිනය.
  - ✓ විස්තරය.
  - ✓ තැන්පතු කිරීම්.
  - ✓ ආපසු ගැනීම්.
  - ✓ ශේෂය.

# ස්ථාවර තැන්පත් ගිණුම් (කාලීන තැන්පතු)

නිශ්චිත කාල සීමාවක් සඳහා ස්ථාවර පොලී ප්‍රතිශතයක් යටතේ ආරම්භ කළ හැකි තැන්පතු ස්ථාවර තැන්පතු ලෙස හැඳින්විය හැකිය.

අවදානම අඩු, සුරක්ෂිත, ලාභදායී ආයෝජන මාර්ගයක් ලෙස තම අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල යෙදවිය හැකිය.

## • ස්ථාවර තැන්පතුවල ලක්ෂණ

I. නිශ්චිත කාලසීමාවක් වෙනුවෙන් තැන්පත් පවත්වාගෙන යාම.
II. තැන්පතු කාලය හා මුදල අනුව පොලී ප්‍රතිශතය වෙනස් වීම.
III. සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුම් වලට වඩා වැඩි පොලී අනුපාතයක් හිමිවීම.
IV. පොලිය මාසිකව හෝ කල් පිරුණු පසු හෝ ගිවිසගත් පරිදි ලබා ගත හැකි වීම.
V. ස්ථාවර තැන්පතුව ඇපයට තබා තැන්පතු වෙන් එක්තරා ප්‍රතිශතයකට ණය මුදලක් ලෙස ලබා ගත හැකි වීම.
VI. තැන්පත් කළ දිනය, තැන්පත් කළ මුදල, පොලිය සහ කල් පිරෙන දින යන විස්තර ඇතුලත් සහතිකයක් බැංකුව විසින් ලබා දීම.

- ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීමේ ක්‍රියා පටිපාටිය.

(I) බැංකුව විසින් ලබාදෙන

- තැන්පතු විවෘත කිරීමේ අයදුම්පත.
- මුදල් තැන්පතු පත.
- දේශීය ආදායම් පනතට අනුව කෙරෙන ප්‍රකාශය.
- ගනුදෙනු කරු පිළිබඳ තොරතුරු දැනගැනීමේ පත්‍රය.

නිවැරදිව සම්පූර්ණ කර, ජාතික හැඳුනුම්පත සමග භාරදිය යුතු වේ.

(II) එම අවශ්‍යතා සම්පූර්ණ කළ පසු බැංකුව විසින් ස්ථාවර තැන්පතු සහතිකයක් ගනුදෙනුකරු වෙත ලබාදේ.

★ ඉතිරිකිරීමේ ගිණුම් හා ස්ථාවර තැන්පත් ගිණුම් අතර වෙනස්කම්.

| ඉතිරිකිරීමේ ගිණුම | ස්ථාවර තැන්පත් ගිණුම |
|---|---|
| සුළු මුදලකින් ආරම්භ කළ හැකිය. | ආරම්භක තැන්පතු මුදල වැඩිය. |
| ඕනෑම විටෙක මුදල් තැන්පතු කළ හැකිය. | වරින්වර මුදල් තැන්පත් කිරීමක් සිදු නොවේ. |
| පොලිය සාපේක්ෂව අඩුය. | පොලිය සාපේක්ෂව වැඩිය. |
| මුදල් ආපසු ලබා ගැනීමේ නිශ්චිත කාල සීමාවක් නැත. | මුදල් ආපසු ලබාගැනීම කළ හැක්කේ කාලය අවසානයේ දී ය. |
| පාස් පොතක් ලැබේ. | තැන්පතු සහතිකයක් ලැබේ. |
| තැන්පතු ඇපයට තබා ණය ලබා ගත නොහැක. | තැන්පතුව ඇපයට තබා යම් ප්‍රතිශතයක් ණය ලබාගත හැක |
| | |
| | |

# ජංගම ගිණුම් Current Account

චෙක් පත් මගින් ගණුදෙනු කිරීම සඳහා වාණිජ බැංකුවක ආරම්භ කරන ගිණුම ජංගම ගිණුම ලෙස හඳුන්වයි. ඒ වෙනුවෙන් වාණිජ බැංකුව විසින් ගිණුම් හිමියාට චෙක්පොතක් ලබා දෙයි.

## ★ ජංගම ගිණුමක් ආරම්භ කිරීමේ ක්‍රියා පටිපාටිය

- ❖ එම වාණිජ බැංකුවෙහි ජංගම ගිණුමක් සක්‍රියව පවත්වාගෙන යනු ලබන පුද්ගලයකු විසින් ඒ සඳහා ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම මගින් නව ගනුදෙනුකරු බැංකුවට හඳුන්වා දිය යුතුය.
- ❖ ජංගම ගිණුම විවෘත කිරීමට අදාළ අයදුම්පත හා මුදල් තැන්පතුපත සම්පූර්ණ කර තැන්පතු මුදල සහ ජාතික හැඳුනුම්පත සමග බැංකුවට භාරදිය යුතුය.

## ජංගම ගිණුමක ලක්‍ෂණ

- ආරම්භ කිරීමේදී කළමනාකරු හමුවිය යුතුය.
- ආරම්භ කිරීමේ දී හඳුන්වාදීමක් අවශ්‍ය කෙරෙයි.
- මූලික තැන්පතුව තරමක් විශාල මුදලකි.
- පොලිය හිමි නොවේ.
- අයිරා පහසුකම් ඇත.
- චෙක් පොතක් ලැබේ.
- මූලික තැන්පතුව බැංකුවෙන් බැංකුවට ශාඛාවෙන් ශාඛාවට වෙනස්ය.
- ශේෂය අඩුවීම හෝ සපයන සේවා වෙනුවෙන් බැංකුව ගාස්තු අය කරයි.
- පුද්ගලයන්ට තනි තනිව හෝ බද්ධව මෙන්ම ව්‍යාපාරවල නමින්ද පවත්වාගෙන යා හැකිය.
- නිතර ආපසු ගැනීමේ පරමාර්ථය.

- ජංගම ගිණුමක් පවත්වාගෙන යාමේ වාසි

⭐චෙක්පත් මගින් ගෙවීම් කළ හැකි වීම.
⭐බැංකු අයිරා පහසුකම් ලබා ගත හැකි වීම.
⭐සෘජු ප්‍රේෂණ රැස් කරවා ගත හැකි වීම.
⭐ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම.
⭐බැංකු ප්‍රකාශනයක් ලැබීම.
⭐බැංකු ණය ලබා ගැනීමේදී පහසුවක් වීම.

## බැංකු අයිරා පහසුකම

- තම ජංගම ගිණුමේ තිබෙන තැන්පතු ශේෂයට වඩා වැඩි මුදලක් සඳහා චෙක්පත් ලිවීමට බැංකුවෙන් ලබාගත් අවසරය බැංකු අයිරා පහසුකම ලෙස හැඳින්වේ.

## බැංකු අයිරාව - Bank Overdraft

- ජංගම ගිණුමේ ඇති වාසිදායක ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කිරීම තුළින් ජංගම ගිණුම් හිමියා විසින් බැංකුවට ණය වී ඇති ප්‍රමාණය බැංකු අයිරාව ලෙස හඳුන්වයි

## බැංකු ප්‍රකාශය – Bank Statement

- බැංකු ජංගම ගිණුමක් හිමි අයෙකුට සාමාන්‍යයෙන් මසකට වරක් බැංකුව සමග සිදුකළ ගනුදෙනුවල විස්තර ඇතුලත් කොට වාණිජ බැංකුව විසින් එවනු ලබන වාර්තාව බැංකු ප්‍රකාශය වේ.

# ජංගම ගිණුම හා සම්බන්ධ ගාස්තු හා වෙනත් අඩුකිරීම්

- චෙක්පත් ගාස්තු.
- දඩ ගාස්තු.
- බැංකු ගාස්තු.
- මුද්දර ගාස්තු.
- අයිරා පොලී.
- තැපැල් ගාස්තු.
- හර බදු.


# චෙක්පත Cheque

ජංගම ගිණුම් හිමියකු විසින් නිශ්චිත මුදලක් එහි නම් සඳහන් පුද්ගලයාට හෝ රැගෙන එන අයෙකුට ගෙවන ලෙස වාණිජ බැංකුවකට කරනු ලබන ලිඛිත නියෝගය "චෙක් පත" ලෙස හැඳින්විය හැකිය.

- **චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව**

★ **අණකරු - ජංගම ගිණුම් හිමියා**
★ **අණලදු - අදාළ වාණිජ බැංකුව**
★ **ආදායකයා - චෙක්පතෙහි මුහුණත නම සඳහන් පුද්ගලයා**

- චෙක්පතක ආදර්ශ ආකෘතියක් පහත දැක්වේ.


COMMERCIAL BANK

COMMERCIAL BANK OF CEYLON PLC - Reg.No.PQ 116

කොමර්ෂල් බැංකුව கொமர்ஷல் வங்கி

BAMBALAPITIYA බම්බලපිටිය பம்பலப்பிட்டிய

දිනය Date திகதி 2 0

D D M M Y Y Y Y

Pay

හෝ රැගෙන එන්නාට Or Bearer அல்லது வருபவரிடம்

රුපියල් Rupees ரூபாய்.

රු. Rs. ரூ.

ගෙවිය செலுத்தவும்

856604 7056 106 110600714

## ● චෙක්පතක ඇතුළත්වන තොරතුරු

- බැංකුවේ නම සහ බැංකු ශාඛාවේ නම.
- දිනය.
- ගෙවනු යනුවෙන් ඇති විධානය.
- ආදායකයාගේ නම.
- විධානයට/රැගෙන එන්නාට යන පද.
- මුදල අකුරෙන් හා ඉලක්කමෙන්.
- අණකරුගේ අත්සන.
- චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුව (M.I.C.R)

- **චෙක්පතේ පිළිපත** (Counter foil)

**චෙක්පත නිකුත් කළ පසු චෙක් පොතේ ඉතිරිවන කොටස "පිළිපත" නමින් හැඳින්වේ. සිදුවූ ගනුදෙනුව පිළිබඳව විස්තර එහි ඇතුළත් කළ යුතුය.**

- M.I.C.R. **චෙක්පත්** (Magnetic Ink Character Recognition)

**අද සෑම වාණිජ බැංකුවක් විසින්ම නිකුත් කරන චෙක්පත්වල චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවක් දැකිය හැකිය. එම චෙක්පත්** M.I.C.R. **චෙක්පත් ලෙස හඳුන්වයි.**

- **එම තීරුවෙහි පහත දැක්වෙන අංක පිළිවෙලින් ඇතුළත් වේ.**

  - චෙක්පත් අංකය.
  - බැංකුවේ අංකය.
  - බැංකු ශාඛා අංකය.
  - බැංකු ගිණුම් අංකය.

## • චෙක්පතක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු වැදගත් කරුණු

- දිනය නිවැරදිව යෙදීම.
- ආදායකයාගේ නම පැහැදිලි අකුරින් නිවැරදිව ලිවීම.
- ඉලක්කමෙන් හා අකුරෙන් ලියන වටිනාකම් නිවැරදි වීම.
- අණකරුගේ අත්සන නිවැරදිව යෙදීම.
- චෙක්පතෙහි සංශෝධන ඇත්නම් ඒවා පැහැදිලිව නිවැරදි කර අත්සන් මගින් සනාථ කළ යුතු වීම.
- පිළිපතෙහි අදාළ තොරතුරු සඳහන් කිරීම.
- චෙක්පතෙහි ඇති චුම්බක තීන්ත ආකාර හැඳුනුම් තීරුවෙහි කිසිවක් නොලිවීම.
- සුදුසු පරිදි රේඛනය කිරීම.

- චෙක්පත් රේඛනය කිරීම

චෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම රේඛනය කිරීම ලෙස හැඳින්වේ.

නමුත් එසේ රේඛා දෙකක් නොමැතිව චෙක්පතේ මුහුණත වාණිජ බැංකුවක නමක් ලිවීමෙන්ද රේඛනයක් සිදුවේ.

- චෙක්පත් රේඛනය කිරීමේ අරමුණ

චෙක්පතකට වැඩි ආරක්ෂාවක් ලබාදීම රේඛනයේ අරමුණ වේ. ඒ අනුව රේඛනය කරන ලද චෙක්පතට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගත නොහැක. එය ලබාගත හැක්කේ බැංකු ගිණුමක තැන්පත් කිරීමෙන් පමණි.

- රේඛන වර්ග

චෙක්පත් රේඛනය කිරීම ආකාර දෙකකට සිදුකළ හැකිය.

## (1) සාමාන්‍ය රේඛනය General crossing

චෙක්පතෙහි මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් යෙදීම හෝ වාණිජ බැංකුවක නමක් හැර, රේඛනයේදී භාවිතා කරන වෙනත් සම්මත ප්‍රකාශනයක් සටහන් කිරීම සාමාන්‍ය රේඛනය ලෙස හැඳින්වේ.

## සාමාන්‍ය රේඛනය සඳහා නිදසුන්





1. අංක 01 රේඛනයෙන් අදහස් වන්නේ චෙක්පත ජංගම ගිණුමකට බැර කළ යුතු බවයි.
2. අංක 02 රේඛනයෙන් අදහස් වන්නේ චෙක්පත පවරනු ලබන පුද්ගලයා සතු හිමිකමට වඩා වැඩි හිමිකමක් පැවරුම් ලාභියාට නොලැබෙන බවයි.
3. අංක 03 රේඛනයෙන් අදහස් වන්නේ චෙක්පතේ වටිනාකම ආදායකයා වශයෙන් නම්කර ඇති පුද්ගලයාගේ ජංගම ගිණුමට පමණක් බැර විය යුතු බවයි

## (02) විශේෂ රේඛනය SPECIAL CROSSING

**චෙක්පත මුහුණත සටහන් කර ඇති සමාන්තර රේඛා දෙක අතර වාණිජ බැංකුවක නමක් ලිවීම විශේෂ රේඛනයක් වේ. රේඛා දෙකක් රහිතව වුවද වාණිජ බැංකුවක නමක් ලිවීම විශේෂ රේඛනයක් වේ.**

## විශේෂ රේඛනය සඳහා නිදසුන්




1. අංක 1 සහ 3 රේඛනවලින් අදහස් වන්නේ එම රේඛනය තුළ සඳහන් බැංකුවෙහිම ගිණුමක තැන්පත් කළ යුතු බවයි.
2. අංක 2 රේඛනයෙන් අදහස් වන්නේ එම රේඛන තුළ සඳහන් බැංකුවේ ආදායකයාගේ ජංගම ගිණුමටම තැන්පත් කළ යුතු බවයි.

මේ අනුව සාමාන්‍ය රේඛනය සහ විශේෂ රේඛනය අතර ප්‍රධාන වෙනස වන්නේ වාණිජ බැංකුවක් නමක් සඳහන් නොකිරීම හා සඳහන් කිරීමයි.

# චෙක්පත් පිටසන් කිරීම (Endorsement)

චෙක්පතේ මුහුණත සඳහන් ආදායකයාගේ නම ඒ ආකාරයටම ඔහුගේ අත්අකුරින් චෙක් පතක පිටුපස ලිවීම චෙක්පතක් පිටසන් කිරීම ලෙස හැඳින්වේ.

## පිටසන් කිරීමේ අර්ථය

- පිටසන් කිරීමෙහි අර්ථය, චෙක්පත නීත්‍යානුකූලව පැවරූ බව සනාථ කිරීමය. එනම් තමාට අදාළ චෙක්පත පිළිබඳ අව්‍යාජ හිමිකමක් පැවති බවයි.

## පිටසන යොදන අවස්ථා

- අන් අයෙකුට පැවරීමේදී.
- ආදායකයා විසින් බැංකු ගිණුමක තැන්පත් කිරීමේදී.
- බැංකුවට ඉදිරිපත් කර මුදල් ලබාගැනීමේදී.

# 02. විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා

වර්තමානයේ බැංකු විසින් විද්‍යුත් සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් මුදල් ගනුදෙනු සඳහා ගනුදෙනුකරුවන්ට විවිධ සේවා හඳුන්වා දී ඇත. එම සේවා විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා ලෙස හැඳින්විය හැකිය.

## විද්‍යුත් මුදල් (Electronic money)

විද්‍යුත් මුදල් යනුවෙන් හඳුන්වනු ලබන්නේ මුදල් හා චෙක්පත් වෙනුවට ආදේශ කළ හැකි ලොව පුරා පිළිගත් පොදු ප්‍රමිතියකට අනුව සකස් කරන ලද සැහැල්ලු ප්ලාස්ටික් කාඩ්පත් විශේෂයකි.

- **විද්‍යුත් මුදල් වර්ග**

★ **ණයපත්** Credit cards
★ **හරපත්** Debit cards
★ **ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත්** Automated Teller Machine Cards

# ණයපත්

වාණිජ බැංකු විසින් ණය පදනම මත ගනුදෙනු කිරීම සඳහා නිකුත් කරනු ලබන කාඩ්පත් විශේෂයකි.

- **මෙහි ලක්ෂණ**

★ ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු නිකුත් කරයි.
★ ණය පදනම මත නිකුත් කරයි.
★ මෙවැනි කාඩ්පතක් ලබාගැනීම පිණිස ගනුදෙනුකරුට බැංකු ගිණුමක් තිබීම අවශ්‍ය නොවේ.
★ අනුමත වෙළෙඳ ආයතනයකට ණයපත ඉදිරිපත් කර නිශ්චිත වටිනාකමක් දක්වා භාණ්ඩ හා සේවා ලබාගත හැකිය.
★ ATM යන්ත්‍රවලින්ද යම් සීමාවක් දක්වා මුදල්ද ලබාගත හැකිය.
★ ණයපත් ආශ්‍රිත ගනුදෙනු සිදුවීම විද්‍යුත් ජාල ඔස්සේ ස්වයංක්‍රීයව සිදුවේ.
★ ණයපත් භාවිතා කොට ලබාගන්නා ණය වටිනාකම් පිළිබඳව බැංකුව විසින් ණයපත් හිමියාට නියමිත කාලසීමාවක් තුළදී දැනුම්දෙන අතර, එම ණය වටිනාකම බැංකුව වෙත පියවීමට ණයපත් හිමියා බැඳී සිටී.



- ජාත්‍යන්තර වශයෙන් භාවිතා වන ප්‍රධාන ණයපත් ජාල

  - වීසා
  - මාස්ටර්
  - american express
  - discover

- අප රටේ වාණිජ බැංකු විසින් නිකුත් කරන ණයපත් සඳහා නිදසුන්

★ ලංකා බැංකුව - සී බෑන්ක් වීසා
★ මහජන බැංකුව - පීපල්ස් කාඩ්
★ සම්පත් බැංකුව - මාස්ටර් කාඩ්
★ සෙලාන් බැංකුව - සෙලාන් වීසා කාඩ්






## ණයපත් භාවිතය මගින් ව්‍යාපාරිකයන්ට අත්වන වාසි

- ව්‍යාපාර වල වෙළඳ පිරිවැටුම වැඩිවීම.
- ව්‍යාපාරික අවදානම අඩු වීම.
- ව්‍යාපාර කටයුතු සරල වීම හා පහසු වීම.
- ගිණුම් කටයුතු පහසු වීම.
- ව්‍යාපාරයට ප්‍රතිචාරයක් ලැබීම.

### ➢ හරපත් (Debit cards)

✓ බැංකු ගිණුමේ ඇති මුදල් වලින් සෘජුවම ගෙවීම් කිරීමට හැකිවන පරිදි වාණිජ බැංකු විසින් තම ගනුදෙනුකරුවන්ට නිකුත් කරන කාඩ්පත් හරපත් ලෙස හඳුන්වයි.



## මෙහි ලකෂණ

- ★ හරපතක් ලබාගැනීම සඳහා බැංකු ගිණුමක් පැවතිය යුතුය.
- ★ මෙම කාඩ්පත මගින් ගිණුමේ ඇති මුදල් ශේෂය දක්වා යම් සමාවකට යටත්ව භාණ්ඩ හා සේවා මිලදී ගත හැකි වේ.
- ★ මෙමගින් භාණ්ඩ හා සේවා ලබාගත් විට අදාළ වටිනාකම සෘජුවම තම බැංකු ගිණුමට හර වේ.
- ★ හරපත්වල විශේෂත්වය වනනේ ගනුදෙනුවකට අදාළ නියමිත වටිනාකම ගැනුම්කරුගේ ගිණුමෙන් අඩුවී බැංකුව හරහා විකුණුම්කරුගේ ගිණුමට මාරුවීමයි.
- ★ හරපතත් භාවිතා කරමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් මුදල් ආපසු ලබාගැනීමටද හැකි වේ.

- ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු විසින් නිකුත් කරන හරපත්වලට නිදසුන්.

- ★ සම්පත් බැංකුව - සෙට්
- ★ කොමර්ෂල් බැංකුව - කැට් සුපර්
- ★ හැටන් නැෂනල් බැංකුව - කෑෂ් ලයින්
- ★ ලංකා බැංකුව - වීසා හර කාඩ්



## ● හරපත් භාවිතය මගින් ව්‍යාපාරිකයින්ට සැලසෙන වාසි

★ වෙළෙඳ පරිවැටුම ඉහළ යාම.
★ චෙක්පත්වලට භාණ්ඩ විකිණීමට වඩා හරපත් සඳහා භාණ්ඩ විකිණීම පහසුවීම සහ අවදානම අඩුවීම.
★ ගිණුම් තැබීම පහසු වීම.

## ස්වංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත (Automated Teller Machine Card) ATM Card

- සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුමකින් ගනුදෙනුකරුවන්ට ලබාගත හැකි සේවාවන්ට සමාන සේවාවක් ලබාගත හැකි වන පරිදි වාණිජ බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන විසින් නිකුත් කරන කාඩ්පත් විශේෂයකි.
- මෙහි සියලුම සේවාවන් සිදුකරනු ලබන්නේ පරිගණකය ආශ්‍රයෙන් ක්‍රියාත්මක කෙරෙන A.T.M. යන්ත්‍රය මගිනි.

## • වාණිජ බැංකු විසින් නිකුත් කරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත් සඳහා නිදසුන්

මහජන බැංකුව - PET

ලංකා බැංකුව - CEY NET

සම්පත් බැංකුව - SET

කොමර්ෂල් බැංකුව - CAT

සෙලාන් බැංකුව - SMART

හැටන් නැෂනල් බැංකුව - Cash Line













## • ටෙලර් කාඩ්පතක දක්නට ලැබෙන මූලික ලක්ෂණ

කාඩ්පත් හිමියාගේ නම.

බැංකුවේ නම.

කාඩ් පත හඳුන්වා දෙන වෙළඳ නාමය.

කාඩ්පත් අංකය.

නිකුත් කළ දිනය.

චුම්බක තීරුව.

කාඩ්පත් හිමියාගේ අත්සන (ඇතැම්විට).

## ● ස්වංක්‍රීය ටෙලර් කාඩ් භාවිතය මගින් ව්‍යාපාරිකයින්ට සැලසෙන වාසි

★ බැංකු කවුන්ටරය වෙත නොගොස් මුදල් තැන්පත් කිරීම, ආපසු ගැනීම, ගිණුම් අතර මුදල් මාරුකිරීම යන කාර්යයන් ඉටුකර ගත හැකි වීම.
★ ආකෘති පත්‍ර පිරවීමක් නොමැති නිසා කාලය ඉතුරු වේ.
★ ගිණුමේ ශේෂය බලාගත හැකි වීම සහ පසුගිය ගනුදෙනු කිහිපයක තොරතුරු ලබාගත හැකි වීම.
★ දවසේ පැය 24 පුරාම සහ සතියේ සියලුම දිනයන්හි විවෘතව පැවතීම.
★ බැංකු ශාඛා පරිගණක ජාලයක් මගින් ක්‍රියාත්මක වන නිසා ඉහත ඕනෑම කාර්යයක් ඕනෑම ශාඛාවකින් ඉටුකරග හැකි වීම.

## ● ඒකීය බැංකු ක්‍රමය Uni Banking System

❖ ඒකීය බැංකුකරණය යටතේ වාණිජ බැංකුවක ඇති සියලුම ශාඛා පරිගණක ගතකර ඇත. ඒ නිසා කාඩ්පත් භාවිතා කර එම බැංකුවේ ඕනෑම බැංකු ශාඛාවකින් ගනුදෙනු කළ හැකිය.

❖ උදා: කොළඹ ජීවත්වන, ලංකා බැංකුවේ ගනුදෙනුකරුවකු යාපනයට පැමිණි අවස්ථාවක යාපනයේ ඇති ලංකා බැංකු ශාඛාවකින් මුදල් ලබාගැනීම.

- අන්තර් බැංකු ක්‍රමය Inter Banking System
- වාණිජ බැංකු වර්ග කිහිපයක් තම ගනුදෙනුකරුවන්ට ඕනෑම බැංකු ශාඛාවකින් ගනුදෙනු කිරීමට හැකිවන පරිදි විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සම්බන්ධතා ජාලයක් ගොඩනගාගැනීමයි.

උදා: ලංකා බැංකුව හා මහජන බැංකුව පරිගණක ජාලයක් මගින් සම්බන්ධ කර ඇති විට ලංකා බැංකුවේ ගනුදෙනුකරුවෙකු මහජන බැංකු ශාඛාවකින් මුදල් ලබාගැනීම.

## ➢ විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවේ වැදගත්කම

(I) ක්ෂණික බව

✓ සියලුම කටයුතු විද්‍යුත් මාධ්‍ය හරහා සිදුවීම නිසා කාර්යයන් පහසුවෙන් හා ඉක්මනින් කරගැනීමෙන් කාලය ඉතිරි වීම.

(II) අවදානම අඩුවීම

✓ මුදල් එහා මෙහා ගෙනයාමේදී ඇති අවදානම මෙම සේවාව නිසා අඩුවීම.

(III) සියලු තොරතුරු ස්වයංක්‍රීයව වාර්තා වීම.

✓ මේ නිසා ගනුදෙනු වාර්තාගත වීම පහසුවෙන් හා නිවැරදිව සිදුවීම.

(IV) දවසේ ඕනෑම වේලාවක ගනුදෙනු කළ හැකි වීම.

## විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවේ ඇති සීමාවන්

(I) දත්ත විනාශවීමේ අවදානමක් පැවතීම. (තාක්‍ෂණික දෝෂ හේතුවෙන්)

(II) නව ආකාරයේ විද්‍යුත් වංචාවලට භාජනය වීමේ අවදානමක් පැවතීම.

උදා: විද්‍යුත් කාඩ්පත්වල රහස්‍ය අංකය (PIN) වංචා කර වෙනත් කෙනෙකුට ගනුදෙනු කළ හැකි වීම.

(III) අමතර පිරිවැයක් දැරීමට සිදුවීම.

උදා: ප්‍රමාද ගාස්තු, පොළී

(IV) ඇතැම් වෙළඳසැල්වලදී ගෙවීම් කිරීමට භාවිතා කළ නොහැකි වීම.